# මාධ්‍ය නිවේදනය

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2021 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2021 වර්ෂය සඳහා**

**2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 3.7 කින් සහ 2021 සිව්වන කාර්තුවේ සියයට 1.8 කින් ප්‍රසාරණයවී ඇත.**


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරිමේ අමාත්‍යාංශය**

දු.ක: 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


……………………………………………………………………………………………………………..

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 සිව්වන කාර්තුව (ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31) සහ 2021 වර්ෂය (ජනවාරි 1 සිට දෙසැම්බර් 31) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල සහ ස්ථාවර මිල (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

සාරාංශය

2021 වර්ෂය සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2020 වර්ෂය තුළ වාර්තා වූ සියයට 3.6 ක ඍණාත්මක වර්ධන වේගය හා සසඳන විට 2021 වර්ෂයේ ආර්ථික වර්ධන වේගය සියයට 3.7 ක ධන වර්ධන වේගයක් ලෙස ඇස්තමේන්තු කර ඇති බව යි.

තව ද, ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 9,532,909 ක් ලෙස 2020 වර්ෂයේ වාර්තා වූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය, 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 9,881,397 ක් ලෙස ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2019 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 9,890,468 ක සිට 2020 වර්ෂයේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 9,532,909 මට්ටම දක්වා අඩු වී තිබුණි.

2021 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ගණනය කර ඇත්තේ ඉහත සඳහන් මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඩු වූ මට්ටම පදනම් කරගෙනය. 2020 වසරේ ආර්ථිකයේ වාර්තා වූ පසුබෑසීමෙන් පසු 2021 වර්ෂයේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වූ මට්ටම පහත රූප සටහනෙන් පිළිබිඹු වේ.




ඊට අමතරව, පවත්නා මිල ගණන් යටතේ 2020 වර්ෂයේ රුපියල් මිලියන 15,027,374 ක් ලෙස වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතය 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 16,809,309 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2020 වර්ෂය හා සැසඳීමේ දී සියයට ධන 11.9 ක වෙනසකි.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා පවත්නා මිල යටතේ 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 9.0 ක්, සියයට 27.8 ක්, සියයට 57.5 ක් ලෙස වාර්තාවන අතර භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු සංරචකය සියයට 5.7 කින් 2021 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට දායකවී ඇත.

2021 වර්ෂයේ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 2.0, සියයට 5.3 සහ සියයට 3.0 ක සුළු ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කර ඇත. 2020 වර්ෂයේ මෙම ක්‍රියාකාරකම්වල වාර්තා වූ පසුබෑසීම්වල ප්‍රතිඵලයක් ලෙස මෙම වර්ධන අනුපාතයන් වාර්තාවී ඇත.

## පසුබිම

2021 වසරේ පළමු, දෙවන සහ තුන්වන කාර්තු සඳහා මෙන්ම පසුගිය 2020 වසර සඳහා ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු කරන ලද කොවිඩ් - 19 වසංගතයේ අහිතකර බලපෑම පිළිබිඹු විය.

මෙම වසංගතය 2019 වසර අවසානයේ සිට ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීමට පටන් ගත් අතර 2020 වසර තුළදී ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන රැල්ල පැතිරීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයට අහිතකර බලපෑම් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂයේදී ආර්ථිකය සියයට 3.6 කින් සංකෝචනය විය. තවද, 2021 වසරේ පළමුවන හා දෙවන කාර්තු දෙකෙහි සෘණ වර්ධන වේගයන් වාර්තා වූ අතර අනෙක් කාර්තු දෙක සඳහා ධනාත්මක වර්ධන අනුපාතයන් වාර්තා විය.

කොවිඩ් - 19 වසංගතයේ දෙවන රැල්ල මධ්‍යයේ 2021 වසර ආරම්භ විය. කෙසේ වෙතත්, දෙවන රැල්ල අවසන් වන විට කොවිඩ් වෛරසය පැතිරීම අඩු වෙමින් පැවතුනි. එබැවින්, 2021 පළමු කාර්තුව පුරාවටම පැවති හිතකර තත්ත්වය බොහෝ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට සහාය වී ඇත. එමෙන්ම 2020 වසරේ පැවති තත්ත්වය හා සසඳන විට ජනතාවට තම එදිනෙදා ජීවන රටාව යම් තරමකට හෝ භුක්ති විඳීමට හැකි විය. පසුගිය වසරේ මෙන් නොව දෙන ලද යම් යම් කොවිඩ් - 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ, 2021 වසරේ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය සැමරීමට ද ජනතාවට හැකියාව ලැබුණි

කෙසේ වෙතත්, සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය නිමවීමත් සමග වසංගතයේ තුන්වන රැල්ලේ බලපෑම ඉහළ ගියේය. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම කොවිඩ් -19 නව ඩෙල්ටා ප්‍රභේදය ආසාදිත රෝගීන් වාර්තාවිය. එපමණක් නොව, කොවිඩ් -19 රෝගීන් සඳහා වාර්තා වූ මරණ අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව වසංගතයේ තුන්වන රැල්ලෙහි බලපෑම හේතුවෙන් නැවතත් 2021 වසරේ දෙවන සහ තෙවන කාර්තුවලට දැඩි බලපෑමක් එල්ල විය. ඒ අනුව කොවිඩ් වසංගතය පැතිරීම පාලනය කිරිම සඳහා පළාත් අතර සංචරණ සීමා සහ සහ දිවයින පුරා නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමට රජයට සිදු විය.

කෙසේ වෙතත්, 2021 වසරේ අගුලු දැමීමේ කාල සීමාවේ ස්වභාවය හා සසඳන විට, එය 2020 වර්ෂයේ දී මෙන් දැඩි නොවීය. නිරෝධායන ඇඳිරි නීති කාල සීමාව තුළ ද කෘෂිකර්මාන්ත ආශ්‍රිත කටයුතු, බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, ඉදිකිරීම් කටයුතු සහ සේවා ආශ්‍රිත බොහෝ ව්‍යාපාර කටයුතු සඳහා සිය කාර්යයන් අඛණ්ඩව කරගෙන යාමට රජය අවසර දෙන ලදී. මෙය වසරේ සෑම කාර්තුවකම ව්‍යාපාර කටයුතු කරගෙන යාමට යම් ආකාරයක හිතකර පරිසරයක් නිර්මාණය කළේය.

2021 වසරේ සිව්වන කාර්තුව, කොවිඩ් -19 වසංගතයේ සිව්වන රැල්ල මධ්‍යයේ ආරම්භ විය. වසංගතයේ පෙර පැනනැගුණ රැලි මෙන් නොව, මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලට සහ ව්‍යාපාර අවහිර කිරීමට සිව්වන රැල්ල එතරම් හානිකර හා අහිතකර ලෙස බලපෑවේ නැත. තවද, රජය විසින් රට පුරා පවත්වන ලද සාර්ථක එන්නත්කරණ වැඩසටහන් හේතුවෙන් මරණ අනුපාතය අඩුවීමට පටන් ගත්තේය.

2020 වසර හා සසඳන විට 2021 වසර පුරා පැවති හිතකර තත්ත්වයන්, 2021 වසරේ තුන්වන කාර්තුව හැර පළමුවන, දෙවන සහ සිව්වන කාර්තුවල ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කිරීමට හේතු වී ඇත. ඒ අනුව 2021 වසරේ පළමුවන, දෙවන, තුන්වන සහ සිව්වන කාර්තු සඳහා වාර්තා වූ වර්ධන අනුපාත පිළිවෙලින් සියයට 4.2, සියයට 12.4, සියයට -1.5 සහ සියයට 1.8 ක් විය.

## කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන්

2020 වර්ෂයේ වාර්තා වූ සියයට 2.2 ක සෘණාත්මක වර්ධනය හා සසඳන විට, 2021 වර්ෂයේ දී සමස්ත කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු සියයට 2.0 කින් සුළු වශයෙන් ප්‍රසාරණයවී තිබේ. කෘෂිකාර්මික කටයුතුවල මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ‘පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව’ (සියයට 11.2), ‘පැළ බෝකිරීම හා කෘෂිකාර්මික සහාය කටයුතු’ (සියයට 10.6), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 9.7), ‘සත්ව නිෂ්පාදනය’ (සියයට 9.7), ‘තේ වගා කිරීම’ (සියයට 7.4), ‘වන වගා සහ දැව’ (සියයට 5.1), 'කුළු බඩු වගා කිරීම' (සියයට 4.5), ‘කරදිය ධීවර කටයුතු’ (සියයට 1.2), වශයෙන් සිදු වූ වර්ධනයන් බලපාන

ලදී. කෙසේ වෙතත්, 2021 වර්ෂය තුළ, 'පළතුරු වගා කිරීම' (සියයට 7.8), 'වී වගා කිරීම' (සියයට 6.7), 'එළවළු වගා කිරීම' (සියයට 2.5), 'රබර් වගා කිරීම' (සියයට 1.7) කින් පසුබෑමට ලක්වී ඇත.

## කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන්

පසුගිය වර්ෂයේ සමස්ත කර්මාන්ත කටයුතු සඳහා වාර්තා වූ පසුබෑසීම හා සසඳන විට 2021 වර්ෂයේදී සමස්ත කර්මාන්ත කටයුතු සියයට 5.3 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

පෙර වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුළ සමස්ත නිමවුම් කර්මාන්තය සියයට 7.2 කින් ප්‍රසාරණයවී ඇත. ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත දෙකක් වන 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' සහ 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' 2021 වර්ෂය තුළ සිය ක්‍රියාකාරකම්වල සියයට 13.8 සහ සියයට 3.1 ක සැලකිය යුතු වර්ධනයන් වාර්තා කර ඇත. ඊට අමතරව, 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන' (සියයට 20.0), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 16.8), 'යන්ත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 12.7), 'වෙනත් නිමවුම් කර්මාන්ත' (සියයට 15.8) සහ 'රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන' (සියයට 4.0) යන ආර්ථික කටයුතු 2020 වසරට සාපේක්ෂව ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත්, 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය' සියයට 30.5 ක සෘණ වර්ධනයක් 2021 වසර තුළ දී වාර්තා කර ඇත.

කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතර, කර්මාන්ත අංශය සඳහා සියයට 6.8 ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' සියයට 1.9 ක සුළු වර්ධනයක් 2021 වසර තුළ වාර්තා කර ඇත. තව ද, 'පතල් හා කැනීම්' කර්මාන්තය ද මෙම වර්ෂය තුළ සියයට 2.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර, 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සියයට 6.1 ක සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' සියයට 4.3 ක ධන වර්ධන වේගයන් මෙම වර්ෂය තුළ දී වාර්තා කර ඇත

## සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන්

2021 වර්ෂය තුළ සමස්ත සේවා අංශයේ ආර්ථික කටයුතු සියයට 3.0 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනය සඳහා 'තොරතුරු තාක්ෂණ සේවා' (සියයට 21.7), 'විදුලි සංදේශ සේවා' (සියයට 16.2), 'මූල්‍ය සේවා' (සියයට 7.5), 'රක්ෂණ සේවා' (සියයට 5.1), 'සෞඛ්‍ය සේවා' (සියයට 5.7) 'අධ්‍යාපනය' (සියයට 4.3) ලෙස සිදුවූ වර්ධනයන් ඉවහල්වී ඇත.

මීට අමතරව, අනෙකුත් සියලුම සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් 2021 වසර තුළ සුළු ප්‍රසාරණයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 'නවාතැන් හා ආහාර පාන සැපයීම' සහ අනෙකුත් සියලුම විනෝදාස්වාදය ආශ්‍රිත ක්‍රියාකාරකම් තවමත් ඒවායේ ප්‍රශස්ත මට්ටමට ළඟා වී නොමැත.

## 2021 සිව්වන කාර්තුවේ වර්ධනයන්

2021 සිව්වන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ 2020 සිව්වන කාර්තුවේ වාර්තා වූ සියයට 1.3 ක ධන වර්ධන වේගය හා සසඳන විට, 2021 සිව්වන කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 1.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති බවයි. ස්ථාවර මිල යටතේ රුපියල් මිලියන 2,766,420 ක් වූ 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය 2021 වසරේ සිව්වන කාර්තුවේ දි රුපියල් මිලියන 2,814,879 දක්වා වර්ධනය වී ඇත. ඊට අමතරව පවත්නා මිල යටතේ රුපියල් මිලියන 4,050,859 ක් වූ 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය 2021 සිව්වන කාර්තුවේ දි රුපියල් මිලියන 4,574,030 දක්වා වෙනස්වී ඇත්තේ සියයට 12.9 ක ප්‍රමාණයකිනි. 2021 වසරේ සිව්වන කාර්තුව තුළ සමස්ත සේවා කටයුතු සියයට 3.8 ක සැලකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර කෘෂිකාර්මික හා කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 4.9 ක සහ සියයට 0.2 ක සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි, 2021 සිව්වන කාර්තුව සහ 2021 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරඇත.

www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP



පී.එම්.පී. අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්